# තවත් හොඳින් යාච්ඤා කරන්න පුළුවන් කොහොමද?

ඔයාගේ යාච්ඤාවලට ඇතුළත් කරන්න පුළුවන් මොන වගේ දේවල්ද කියලත් යාච්ඤාව තවත් අර්ථවත් කරගන්න කරන්න පුළුවන් මොනවාද කියලත් තේරුම්ගන්න මේ වැඩ පිටුව ඔයාට උදව් වෙයි.

## ඇතුළත් කරන්න පුළුවන් දේවල්

**හැම යාච්ඤාවකදීම වගේ ඔයා කියන්නේ එක වගේ දේවල් කියලා ඔයාට හිතෙනවාද? එහෙමනම් මෙහෙම කරලා බලන්න:**

ඔයා දෙවියන්ට ස්තුති කරන්න කැමති දේවල් තුනක් ලියන්න.

1. ______________________

2. ______________________

3. ______________________

*“යෙහෝවා දෙවියන්ට ස්තුති කරද්දී දෙවියන් මං වෙනුවෙන් කරලා තියෙන හැම දෙයක් ගැනම මට මතක් වෙනවා. එතකොට දෙවියන් ගැන මගේ හිතේ තියෙන ආදරේ තවත් වැඩි වෙලා දෙවියන්ට තව තවත් ස්තුති කරන්න හිතෙනවා.” —ජැනට්.*

ඔයා කනස්සලු වෙන දේවල් තුනක් ගැන ලියන්න.

1. ______________________

2. ______________________

3. ______________________

*“මගේ හිතේ තියෙන හැම ප්‍රශ්නයක් ගැනම යෙහෝවා දෙවියන්ට කියද්දී මට ලොකු සහනයක් දැනෙනවා. මට දැනෙන්නේ මං මගේ හොඳම යාළුවාට කතා කරනවා වගේ.” —කියාරා.*

අමාරු අවස්ථාවලට මුහුණ දෙන, ඔයා දන්න තුන්දෙනෙක් ගැන ලියන්න.

1. ______________________

2. ______________________

3. ______________________

*“දුර රටවල ඉන්න වගේම ළඟ ඉන්න ප්‍රශ්න අද්දකින සහෝදර සහෝදරියන් ගැන යාච්ඤා කරන එක හොඳ දෙයක්.” —ෂෙල්බි.*

**ඔයාගේ යාච්ඤාවට ඇතුළත් කරන්න පුළුවන් දේවල් නවයක් දැන් ඔයා දන්නවා.**

## යෝජනාවක්:

***“යාච්ඤා කරන්න පුළුවන් දේවල් ගැන ලැයිස්තුවක් හදාගන්න. යාච්ඤා කරන්න කලින් ඒ ලැයිස්තුව බලන්න. ඒ ලැයිස්තුවට තවත් ගොඩක් දේවල් ඇතුළත් කරන්න ඕනෙ කියලා කාලයක් යද්දී ඔයාට තේරෙයි. ඔයාගේ හිතේ තියෙන හැම දෙයක් ගැනම යෙහෝවා දෙවියන්ට කියන්න එක ඔයාට උදව් වෙයි.” —සියාරා.***



www.jw.org © 2017 Watch Tower Bible and Tract Society of Pennsylvania

# අර්ථවත් කරගන්න

**යාච්ඤා කරද්දී ඔයාට මේවායින් අමාරු වෙලා තියෙන්නේ මොන එකද?**

## හදවතින්ම යාච්ඤා කරන එක

(හෙබ්‍රෙව් 5:7 බලන්න.)

## හැමදාම යාච්ඤා කරන එක

(1 තෙසලෝනික 5:17 බලන්න.)

## වැඩිපුර වෙලාවක් යාච්ඤා කරන එක

(1 සාමුවෙල් 1:12 බලන්න.)

**යාච්ඤාව තවත් අර්ථවත් කරගන්න ඔයාට තියාගන්න පුළුවන් මොන වගේ ඉලක්කයක්ද?**



*"සමහර වෙලාවලට මටම තේරෙනවා මං යෙහෝවා දෙවියන්ට කියන්නේ මගේ හිතෙන්ම එන දේවල් නෙමෙයි කියලා. මට ඇත්තටම හිතෙන දේවල් කියන්න නම් මං හිතලාම ඒ වෙනුවෙන් මහන්සි වෙන්න ඕනේ."—ලෝරන්.*

**මගේ ඉලක්කය:** ____________________

____________________

____________________

____________________

____________________



*"යාළුවන්ට මෙසේජ් යවන්න, කෝල් කරන්න අපි කොහොම හරි වෙලාව හොයාගන්නවනේ. එහෙනම් යෙහෝවා දෙවියන් එක්ක කතා කරන්නත් අපි වෙලාව හොයාගන්න ඕනෙ නේද? වෙන කිසිම කෙනෙක් එක්ක කතා කරනවාට වඩා වටින්නේ ඔහුත් එක්ක කතා කරන එකයි."—අලානා.*

**මගේ ඉලක්කය:** ____________________

____________________

____________________

____________________

____________________



*"වැඩිපුර වෙලාව අරන් යාච්ඤා කරන එක හුඟක් වටිනවා. මොකද හිතේ තියෙන හැම දෙයක්ම යෙහෝවා දෙවියන්ට කියන්න එතකොට පුළුවන්."—තෙරේසා.*

**මගේ ඉලක්කය:** ____________________

____________________

____________________

____________________

____________________



www.jw.org © 2017 Watch Tower Bible and Tract Society of Pennsylvania

# යෝජනා



## ඕනෙම වෙලාවක ඕනෙම දෙයක් ගැන කියන්න

මරියා මෙහෙම කියනවා. “දවසක් අහස දැක්කාම මට ආස හිතුණා. පුදුම ලස්සනක් තිබුණේ. ඒ ගැන මං ඒ වෙලාවෙම යෙහෝවා දෙවියන්ට ස්තුති කළා. දෙවියන්ගේ නිර්මාණ කොයි තරම් ලස්සනයිද කියලා මං දෙවියන්ට කිව්වා.”



## නිදහසේ කතා කරන්න පුළුවන් තැන් හොයාගන්න

කිම්බලී මෙහෙම කියනවා. “සමහර වෙලාවට මං වත්තට ගිහින් යාච්ඤා කරනවා. මොකද යෙහෝවා දෙවියන්ගේ නිර්මාණවලින් වට වෙලා ඉද්දී මට දැනෙන්නේ දෙවියන් මං ළඟින්ම ඉඳන් මගේ යාච්ඤා අහගෙන ඉන්නවා වගේ.”

**නිදහසේ කතා කරන්න පුළුවන් තැන්:**

______________________________

______________________________

______________________________

## බයිබලයේ තියෙන යාච්ඤා කියවන්න

හෙලෙනා මෙහෙම කියනවා. “ගීතාවලිය පොත කියවන්න මං හරිම ආසයි. යෙහෝවා දෙවියන්ට යාච්ඤා කරද්දී වෙන අය එයාලගේ හිතේ තියෙන දේවල් වචනවලට පෙරළන්නේ කොහොමද කියලා තේරුම්ගන්න එක මට උදව් වෙනවා. එයාලා වගේ මමත් මගේ හිතේ තියෙන දේවල් යෙහෝවා දෙවියන්ට කියන්න පෙලඹෙනවා.”

**බයිබලයේ තියෙන යාච්ඤා අතරින් මං වැඩියෙන්ම කැමති යාච්ඤා:**

______________________________

______________________________




www.jw.org © 2017 Watch Tower Bible and Tract Society of Pennsylvania